කාර්යසාධන වාර්තාව

2024

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

මුදල්,ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය : 243

අන්තර්ගතය

01 පරිච්ඡේදය – ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 3

1.1 හැඳින්වීම 3

1.2 ආයතනයේ දැක්ම මෙහෙවර හා අරමුණු 4

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6

1.5 දෙපාර්තමේන්තු අරමුදල 6

1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර 6

02 පරිච්ඡේදය - ප්‍රගතිය සහ ඉදිරි දැක්ම 7

2.1 පසුබිම 7

2.2 සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රම (SMELoc) ව්‍යාපෘති ප්‍රගතිය 8

2.3 ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය (MSME) නැවත නගා සිටුවීම. 8

2.4 මූල්‍ය ප්‍රදානයක් මගින් පොහොර සහනාධාරය ලබා දීම 12

2.5 ක්ෂුද්‍ර මූල්‍ය කර්මාන්තය සඳහා විස්තීර්ණ නියාමන රාමුවක් ස්ථාපිත කිරීම 12

2.6 ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම 13

2.7 අඩු ආදායම්ලාභී පවුල් වෙත සහල් බෙදාදීම 13

2.8 වී මිලදී ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් වෙත ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම 13

2.9 බලපත්‍රලාභී බැංකුවල රන් භාණ්ඩ උකස් කර ඇති පුද්ගලයින්ට සහන සැලසීම 14

2.10 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (ICL) ඇමරිකානු ඩොලර් මිලියන 1,000 14

2.11 සීමාසහිත ජාතික ණය සුරකුම් ආයතනය (NCGIL) 15

03 පරිච්ඡේදය– 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 16

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 16

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 17

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 18

3.4 මූල්‍ය ප්‍රකාශන සටහන් 19

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය. 20

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝග ගැනීමේ කාර්ය සාධනය 20

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 20

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය. 21

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 22

04 පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක...28

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 28

05 පරිච්ඡේදය – තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය (SDGs).........29

5.1. හැදින්වීම 29

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්යසාධනය 29

06 පරිච්ඡේදය – මානව සම්පත් පැතිකඩ...39

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න. 39

6.3 මානව සම්පත් සංවර්ධනය 39

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව 45

01 පරිච්ඡේදය – ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් ජාතික දළ දේශීය නිෂ්පාදිතයට (GDP) සැලකිය යුතු දායකත්වයක් ලබා දීම සැලකිල්ලට ගනිමින්, 2005 වර්ෂයේ දී භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එහි මූලික අරමුණ වූයේ මූල්‍යකරණය, වෙළඳපොළ සහ තාක්ෂණය වැනි තීරණාත්මක සම්පත් වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම සහ බලගැන්වීමයි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වර්ධනය පෝෂණය කිරීම සඳහා අදාළ ප්‍රතිපත්ති සහ උපායමාර්ගික රාමු සකස් කිරීම දෙපාර්තමේන්තුවේ මූලික වගකීමට ඇතුළත් වේ. පසුව, ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, දරිද්‍රතාවය අඩු කිරීම සහ රැකියා අවස්ථා උත්පාදනය කිරීමේදී ඔවුන්ගේ අත්‍යවශ්‍ය කාර්යභාරය හඳුනා ගනිමින්, ක්ෂුද්‍ර ව්‍යවසායන් ඇතුළත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ විෂය පථය පුළුල් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යයන් දැන් ප්‍රධාන අංශ දෙකක් යටතේ, මූල්‍ය විසඳුම් සහ වෙළඳපොළ ප්‍රවේශය සහ සංවර්ධනය ලෙස උපායමාර්ගිකව සංවිධානය කර ඇත:

1.1.1 මූල්‍ය විසඳුම්

අනෙකුත් නැගී එන ආර්ථිකයන් හා සමානව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ශ්‍රී ලංකා ආර්ථිකයේ ද ප්‍රධානතම අංශය වන අතර එය රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 52කටත්, සේවා නියුක්තිය සඳහා සියයට 45කටත් අපනයනවලින් සියයට 20කටත් දායක වේ. එබැවින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය පුළුල් කිරීම වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදීමට, අපනයන විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීමට, කලාපීය විෂමතා අවම කිරීමට සහ පසුගාමී ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වේ. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික පසුබෑම යන ත්‍රිත්ව බලපෑම් වලට මුහුණ දීමට ව්‍යාපාරවලට සිදු වූ බැවින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වඩාත් අවදානමට ලක් වූ අංශය බවට පත් වූ අතර එම ව්‍යවසායකයින් තවදුරටත් වෙළඳපොල තුල රැඳී සිටීමට සහ ඔවුන්ගේ ව්‍යාපාර තිරසාර ලෙස පවත්වාගෙන යාමට අරගලයක යෙදෙමින් සිටී. ඊට අමතරව, ක්ෂුද්‍ර මූල්‍යකරණය පුළුල් ලෙස පිළිගත් මූල්‍ය මෙවලමක් වන අතර එය අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය සේවා සැපයීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් ආර්ථික සංවර්ධනයට ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගැනීමේදී ඔවුන්ගේ මූල්‍ය ප්‍රවේශය සඳහා ඇති හැකියාව වැඩි කර දරිද්‍රතා මට්ටම අඩු කිරීම ද සිදු කරනු ලබයි. නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සැලකිය යුතු ප්‍රමාණයක් ඇති බැවින්, අවදානමට ලක්විය හැකි අඩු ආදායම්ලාභීන් ණය උගුලට හසු වීම් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කිරීමට නීති සම්පාදනය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට මූල්‍ය ප්‍රවේශ සඳහා පහසුකම් සැලසීම සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශය නියාමනය කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ විෂයපථය යටතේ පවතින බැවින්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව ඊට අදාළ ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම මෙන්ම මූල්‍ය හා මූල්‍ය නොවන වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එසේම, ක්ෂුද්‍ර මූල්‍ය අංශය නියාමනය කිරීම සඳහා අවශ්‍ය නියාමන යාන්ත්‍රණය බල ගැන්වීමෙන් අඩු ආදායම්ලාභී ප්‍රජාවන් මූල්‍ය සූරාකෑම් වලින් ආරක්ෂා කරමින් රටේ මූල්‍ය පද්ධතිය කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය ගොඩනැංවීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමද මෙම දෙපාර්තමේනතුව විසින් සිදු කරයි.

1.1.2 වෙළඳපොළ ප්‍රවේශය සහ සංවර්ධනය

නිෂ්පාදකයින්ට සාධාරණ මිලක් සහතික කරන අතරතුර, වෙළඳපොළ මිල ස්ථාවර කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සහ අනෙකුත් වෙළඳපොළ සාධක කෙරෙහි අවධානය යොමු කරමින් අතිරික්ත බෝග අස්වැන්න කළමනාකරණය කිරීම සහ ඉල්ලුම් සහ සැපයුම් අංශවල අසමානතා තුලනය කිරීම සඳහා ඉඩප්‍රස්ථා සකස් කිරීම ඉතා වැදගත් වේ. තවද, රට තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට කටයුතු සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, සහතික මිලට වී මිලදී ගැනීම, අඩු ආදායම්ලාභීන් සඳහා සහය ලබාදීම, සහනදායී ණය, භාණ්ඩාගාර ඇපකර, ගබඩා පහසුකම් සහ තාක්ෂණික සහාය යනාදී රජයේ දිරිගැන්වීම් ලබාදීම මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් සිදුකරණු ලැබේ. අඩු ආදායම්ලාභී ජනතාවට තම ජීවන තත්ත්වය පවත්වාගෙන යාමට සහයෝගය ලබා දෙන අතරතුර, ගොවීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීමත්, ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායකවීමට හැකියාව පවතින නව ව්‍යවසායකයින් බිහි කිරීමත් ඉහත දිරිගැන්වීම් මගින් සිදු කරණු ලබයි.

1.2 ආයතනයේ දැක්ම මෙහෙවර හා අරමුණු

1.2.1 දැක්ම

"සංවර්ධන මූල්‍ය සඳහා අවශ්‍ය පහසුකම් සපයන රජයේ ප්‍රමුඛ නියෝජිත ආයතනය බවට පත්වීම."

1.2.2 මෙහෙවර

"අදාළ පාර්ශවයන්ගේ මැදිහත්වීම ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම හා ප්‍රාථමික ව්‍යවසාය අංශය මූල්‍යනය හා ඊට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම"

1.2.3 අරමුණු

"සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නඟා සිටුවීම"

1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා වැඩසටහන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

1.3.2 වෙළඳපොල දත්ත විශ්ලේෂණය කර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි දියුණුවට බලපාන ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ඵලදායී විසඳුම් ලබා දීම.

1.3.3 ආර්ථික සංවර්ධනය උදෙසා රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සහනාධාර වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

1.3.4 වෙළඳපොල අවශ්‍යතාවයන් අනුව, බැංකු, රක්ෂණය, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ මූල්‍ය අංශයන්ට අදාළ නීති බලගැන්වීම සඳහා අවශ්‍ය සහසුකම් සැලසීම.

1.3.5 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, බැංකු, මූල්‍ය වෙළඳපොල සහ අනෙකුත් අංශයන්ට අදාළව රජයේ වාර්ෂික අයවැය සැකසීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම.

1.3.6 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, ප්‍රාථමික ව්‍යවසාය අංශය සහ අනෙකුත් අංශයන්ට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

1.3.7 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳව කෘෂිකාර්මික, කාර්මික, හා සේවා යන අංශ යටතේ දත්ත රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීම මඟින් පවතින දුෂ්කරතා හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනා ගැනීම.

1.3.8 රජයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සහන යෝජනා ක්‍රම පිළිබඳව සොයා බැලීම.

1.3.9 රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් හි සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකු හා මූල්‍ය පහසුකම් ලබා දීම.

සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
විශේෂ ශ්‍රේණිය (විවෘත)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී.ලං.කු.සේ. (විශේෂ ශ්‍රේණිය)
මූල්‍ය විසඳුම්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී.ලං.කු.සේ. (විශේෂ ශ්‍රේණිය)
වෙළඳපොළ ප්‍රවේශය සහ සංවර්ධනය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය)
පාලන
අධ්‍යක්ෂ
ශ්‍රී.ලං.ප.සේ. - I
ශ්‍රී.ලං.කු.සේ. - I
ශ්‍රී.ලං.ග.සේ. - I
පාලන
නි.අ./ස.අ.
ශ්‍රී.ලං.ප.සේ. - II/III
ශ්‍රී.ලං.කු.සේ . - II/III
ශ්‍රී.ලං.ග.සේ. - II/III
ශ්‍රී.ලං.ග.සේ. II/III
මූල්‍ය
සං.නි.
තො.ස.තා.නි.
තො.ස.තා.ස.
ප්‍ර.ක.සේ.නි.
ක.සේ.නි. (4)
ක.සේ.නි. (1)
ක.ස.
කා.කා.ස. (6)
රියදුරු (6)
ක.සේ.නි. (5)

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.4.1 මූල්‍ය විසඳුම්

1.4.2 වෙළඳපොළ ප්‍රවේශය සහ සංවර්ධනය

1.4.3 පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය

1.5 දෙපාර්තමේන්තු අරමුදල

අදාළ නොවේ.

1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

ව්‍යාපෘති නාමය	දායකත්වය ලබාදෙන ආයතන	ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි)	ව්‍යාපෘති කාලසීමාව
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ව්‍යාපෘතිය (SMELoC)	ආසියානු සංවර්ධන බැංකුව	69,623	2016 - 2024
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය (SMELoC2)	ආසියානු සංවර්ධන බැංකුව	14,839.96	2024 - 2030

02 පරිච්ඡේදය - ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2.1 පසුබිම

සංවර්ධනය වෙමින් පවතින අනෙකුත් ආර්ථිකයන් හා සමානව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයමින් ආර්ථිකයේ කොඳු නාරටිය බවට පත්ව ඇත. මෙම අංශය ශක්තිමත් කිරීම, ආර්ථික වර්ධනයක් ඇති කිරීම, කලාපීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ කාර්මික නවෝත්පාදනයන් මෙහෙයවීම සඳහා ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, මූල්‍ය සඳහා සීමිත ප්‍රවේශය, වෙළඳපල සීමාවන්, තාක්ෂණික හිඩැස්, නියාමන බාධක සහ ආර්ථික කම්පන වලට ගොදුරු වීමේ අවදානම වැනි අභියෝග තවමත් අඛණ්ඩව පවතින අතර එය සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ගේ දායකත්වය ආර්ථික වර්ධනයට පූර්ණ ලෙස ලබා ගැනීමට බාධාවකි.

මෙම අභියෝග හඳුනා ගනිමින්, රජය තම ආර්ථික පරිවර්තන න්‍යාය පත්‍රයේ මූලික අංගයක් ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන උපායමාර්ගික රාමු වැඩ සඳහා ප්‍රමුඛත්වය දී ඇත. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, දැරිය හැකි මූල්‍ය සඳහා ප්‍රවේශය , තාක්ෂණය සහ තිරසාර භාවිතයන් ඒකාබද්ධ කිරීම තුළින් තරඟකාරී සහ ඔරොත්තු දෙන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයක් සක්‍රීය කිරීම කෙරෙහි මෙමගින් අවධානය යොමු කරයි. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව (DFD) ප්‍රතිපත්ති සකස් කිරීම, ඉලක්කගත මූල්‍ය මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සහ ආයතනික සහයෝගය ශක්තිමත් කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ව්‍යාපාරික පරිසරය සක්‍රීය කිරීම මගින් මෙම උත්සාහයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (SME LOC) සහ රජයේ අරමුදල් සහිත පුණර්ජීවන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගන් 2024 වසරේදී නිෂ්පාදන, අපනයන, සංචාරක සහ හරිත ව්‍යවසායන් ඇතුළු ප්‍රමුඛතා අංශ සඳහා මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු පියවර කිහිපයක් ගන්නා ලදී. තවද, සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය (NCGIL) ආරම්භ කිරීම තුලින් ඇපකර නොමැති වීම හේතුවෙන් ඇතිවන ධාරිතා සීමාවන් වැනි අභියෝග ජය ගැනීමට හා එමඟින් මෙම ව්‍යාපාර සඳහා ණය සඳහා වඩා හොඳ ප්‍රවේශයක් ලබා ගැනීම පහසු කරන අතර ක්ෂුද්‍ර මූල්‍ය අංශය ශක්තිමත් කිරීම තුලින් නියාමන පියවර හඳුන්වා දීම හා අඩු ආදායම්ලාභී ණය ගැතියන් සූරාකෑමෙන් ආරක්ෂා කරන මූල්‍ය ප්‍රවේශ ශක්තිමත් කරයි. ඊට අමතරව, 'කාන්තා නායකත්වය දරන ව්‍යාපාර' වර්ගීකරණය සඳහා "ජාතික නිර්වචනය" ප්‍රකාශයට පත් කිරීමට සහ ආසියානු සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ මූල්‍ය ආයතනය සමඟ සහයෝගයෙන් කාන්තා ව්‍යවසායකයින්ගේ මූල්‍ය සංග්‍රහය ("WE Finance Code ") හඳුන්වා දීමට අත්‍යවශ්‍ය පියවර ගෙන ඇති අතර දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති ප්‍රවර්ධනයට කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර පිළිබඳව ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් කරන ලද මූල්‍ය හා මූල්‍ය නොවන දත්ත ලබා ගැනීමේ අරමුණින් කාන්තා මූලික ව්‍යාපාර සඳහා සහාය වීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත.

තවද විකල්ප මූල්‍ය ආධාරක පුළුල් කිරීම, වෙළඳපල සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම රජයේ අරමුණ වේ. ණය සුරැකුම් යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම, ඩිජිටල් මූල්‍යකරණ විසඳුම් ක්‍රියාත්මක කිරීම සහ තිරසාර ව්‍යාපාරික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ දිගුකාලීන වර්ධනය සහ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා වැදගත් වනු ඇත.

2.2 සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රම (SMELoc) ව්‍යාපෘති ප්‍රගතිය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ව්‍යාපෘති ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් අරමුදල් සපයන ලද 2024 වර්ෂය තුළදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය මාර්ග සංවරකය යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතන 13 ක් හරහා ආයෝජන ණය ලෙස මිලියන 8316 ක් ප්‍රතිලාභීන් 744 දෙනෙකු සඳහා ලබා දෙන ලදී. තවද, කුඩා තේ වතු හිමියන් 872 දෙනෙකු සඳහා නව වගාවන් ආරම්භ කිරීම, නැවත වගාවන් කිරීම,පාළු කැපීම, ජල සම්පාදනය, පැළ තවාන් සංවර්ධනය හා යාන්ත්‍රීකරණය සඳහා රුපියල් මිලියන 1,410 කට ආසන්න මුදලක් ලබා දුන් අතර, තේ නව වගාවන් සහ නැවත වගාව සඳහා පමණක් දරිද්‍රතාවය අඩු කිරීමේ ජපන් අරමුදල් (Japan Funded for poverty Reduction) ප්‍රදාන මඟින් කුඩා තේ වතු හිමියන් 567 දෙනෙකු සඳහා රුපියල් මිලියන 78 ක් වටිනා ප්‍රදාන ලබා දී ඇත.
උක්ත ණය වැඩසටහනට අමතරව, ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩි දියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 100ක් ලබා දුන් අතර, එයින් ඇමරිකානු ඩොලර් මිලියන 50ක් SMELOC2 ව්‍යාපෘතිය යටතේ , පසුගිය වසර කිහිපය තුළ ආර්ථිකයට ඇති වූ හදිසි කම්පන හේතුවෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) සඳහා තව දුරටත් සහාය වීමට යොදවන ලදී. ඉතිරි ඇමරිකානු ඩොලර් මිලියන 50 ක මුදල ජාතික ණය සුරැකුම් ආයතනයේ මූලික ආයෝජනය සඳහා වෙන් කරන ලදී. මීට අදාල ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ණය ගිවිසුම 2024 මාර්තු 25 වන දින අත්සන් කරන ලදී. SMELOC2 ව්‍යාපෘතියේ පළමු අත්තිකාරම යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන දහතුනක් (13) හරහා ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 912 ක් සඳහා රුපියල් මිලියන 5,609 ක් ආසන්න වශයෙන් ලබා දී ඇති අතර, එයින් කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යවසායන් සඳහා රුපියල් මිලියන 1,930 ක පමණ ණය ලබා දී ඇත.එසේම, ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි දේශගුණික හා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා රුපියල් මිලියන 1,397 කට ආසන්න ණය ලබා දී ඇත. 2024 නොවැම්බර් මාසයේදී දෙවන අත්තිකාරම ලෙස සුදුසුකම් ලත් මූල්‍ය ආයතන දහයක් (10) අතර රුපියල් මිලියන 8,000 කට ආසන්න බෙදා හරින ලදී.

2.3 ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය (MSME) නැවත නගා සිටුවීම.

ශ්‍රී ලංකා රජය විවිධ සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සහාය ලබාගෙන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර ලබා දීමට කටයුතු කර ඇත. එසේ වුව ද, මෑත කාලයේ රටේ ඇති වූ ආර්ථික පසුබෑම නිෂ්පාදන, ආනයන, අපනයන, සංචාරක සහ ඇඟලුම් ඇතුළු බහුවිධ කර්මාන්තවල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. එම අර්බුදයෙන් සිදු වූ බලපෑම කළමනාකරණය කරගනිමින් තම ව්‍යාපාර පවත්වාගෙන යාමට හැකි වූ ව්‍යවසායකයින්ට ණය හෝ ප්‍රාග්ධන ආයෝජන ආකාරයෙන් බාහිර මූල්‍ය ආධාර අවශ්‍ය වී ඇත.

මෙම අභියෝගයට විසඳුම් ලෙස සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා පුනර්ජීවන පැකේජයක් හඳුන්වා දෙන ලදී. මෙම පුනර්ජීවන පැකේජය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාකාරී ණය කාණ්ඩය යටතේ (PL - සංරචකය I) යටතේ අයෝජන ණය ද අක්‍රිය ණය කාණ්ඩය (NPL - සංරචකය II) යටතේ කාරක ප්‍රාග්ධන ණය ලබා ගැනීමට ද පහසුකම් සපයා දී ඇත. ඊට අමතරව, දේශගුණික විපර්යාස ඇතුළුව ඔවුන්ගේ ව්‍යාපාරික පරිසරයේ සිදුවන වෙනස්කම් මගින් එල්ල වන අභියෝගවලට අනුවර්තනය වීමේ හැකියාව වැඩිදියුණු කිරීම ද මෙම ණය යෝජනාක්‍රමයේ අරමුණයි. මෙම වැඩසටහන මඟින් කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, නිෂ්පාදන, තාක්ෂණය සහ අපනයනය අරමුණු කරගත් අංශවල මෙන්ම, කාරක ප්‍රාග්ධන සහාය අවශ්‍ය කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන අංශවල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ. ඒ අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන 15ක් හරහා සහන පොලී අනුපාත යටතේ ණය ලබා දෙනු ඇත. මූල්‍ය සහාය අවශ්‍ය වන සහ ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ හැකියාව පෙන්නුම් කරන සුදුසුකම් ලත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිර්දේශ ලිපි නිකුත් කරන ලදී.

ප්‍රධාන නිර්ණායක:

1. ආරම්භක දිනය: 2024 ජූලි 18 (නිල)
2. ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය සක්‍රිය කිරීම: 2024 අගෝස්තු සිට
3. 2024 දී වෙන් කරන ලද මුදල: රු. බිලියන 16 (භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම පරිදි නිකුත් කරයි)
4. 2025 සංක්ෂිප්ත මුදල: රු. බිලියන 20

නිර්ණායක	සංරචකය I	සංරචකය II
උපරිම ණය මුදල	රු. මි. 15	රු. මි. 5
ආපසු ගෙවන කාලය(උපරිම)	අවුරුදු 10	අවුරුදු 5
පොලී අනුපාතය	7%	8%
වෙන් කළ මුදල	රු. බි. 15	රු. බි. 3
ණය වර්ග	ආයෝජන	කාරක ප්‍රාග්ධනය
සඵලදායී පොලීඅනුපාතය	3% (වාර්ෂිකව)	4% (වාර්ෂිකව)

2024.12.31 වන විට ණය යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

බැංකුවේ නම	ප්‍රතිපාදන රු.මි.	අනුමත ණය සංඛ්‍යාව					ප්‍රතිමූල්‍යකරණය		
		ණය සංඛ්‍යාව	අනුමත ණය මුදල රු.මි.	% මුළු ණය සංඛ්‍යාව	% ප්‍රතිපාදන	% අනුමත ණය මුදල	ණය මුදල රු.මි.	% ප්‍රතිපාදන	% අනුමත මුදල
ලංකා බැංකුව	1005.0	117	1005.0	10.1	100.0	9.3	985.0	98.0	98.0
සම්පත් බැංකුව	1000.0	81	986.5	7.0	98.7	9.1	986.5	98.7	100.0
සෙලාන් බැංකුව	765.0	66	759.1	5.7	99.2	7.0	612.0	80.0	80.6
කොමර්ෂල් බැංකුව	1000.0	68	781.9	5.8	78.2	7.2	781.9	78.2	100.0
ඩී.එෆ්.සී.සී බැංකුව	1034.0	90	1034.0	7.7	100.0	9.5	1000.0	96.7	96.7
ජාතික සංවර්ධන බැංකුව	750.0	56	718.6	4.8	95.8	6.6	646.2	86.2	89.9
හැටන් නැෂනල් බැංකුව	850.0	89	846.1	7.7	99.5	7.8	831.6	97.8	98.3
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	852.2	166	852.2	14.3	100.0	7.8	766.8	90.0	90.0
මහජන බැංකුව	750.0	69	750.0	5.9	100.0	6.9	750.0	100.0	100.0
යුනියන් බැංකුව	774.0	59	774.0	5.1	100.0	7.1	759.6	98.1	98.1
නේෂන් ට්‍රස්ට් බැංකුව	786.2	61	786.2	5.2	100.0	7.2	662.3	84.3	84.3
පැන් ඒෂියා බැංකුව	769.3	64	769.3	5.5	100.0	7.1	617.8	80.3	80.3
සණස සංවර්ධන බැංකුව	764.9	155	764.9	13.3	100.0	7.0	720.8	94.2	94.2
රාජ්‍ය උකස් හා ආයොජන බැංකුව	750.0	14	57.4	1.2	7.7	0.5	30.4	4.1	53.0
කාර්ගිලිස් බැංකුව	750.0	8	78.5	0.7	10.5	0.7	78.1	10.4	99.4
එකතුව	**12,600.6**	**1,163**	**10,963.7**	**100.0**	**87.0**	**100.0**	**10,228.9**	**81**	**93**

2024.12.31 දිනට අක්‍රිය ණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

බැංකුවේ නම	ප්‍රතිපාදන රු.මි.	අනුමත ණය සංඛ්‍යාව					ප්‍රතිමූල්‍යකරණය		
		ණය සං ඛ්‍යාව	අනුමත ණය මුදල රු.මි.	% මුළු ණය සංඛ්‍යා ව	% ප්‍රතිපාද න	% අනුමත ණය මුදල	ණය මුදල රු.මි.	% ප්‍රතිපා දන	% අනුමත මුදල
ලංකා බැංකුව	200	9	39.5	81.8	19.8	86.8	39.5		100
සම්පත් බැංකුව	200			-	-		-		
සෙලාන් බැංකුව	200		-	-	-		-		
කොමර්ෂල් බැංකුව	200	1	1.0	9.1	0.50	2.20	1.0		100
ඩී.එෆ්.සී.සී බැංකුව	200	1	5.0	9.1	2.50	11	5.0		100
ජාතික සංවර්ධන බැංකුව	200		-	-	-		-		
හැටන් නැෂනල් බැංකුව	200		-	-	-		-		
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	200		-	-	-		-		
මහජන බැංකුව	200		-	-	-		-		
යූනියන් බැංකුව	200		-	-	-		-		
නේෂන් ට්‍රස්ට් බැංකුව	200		-	-	-		-		
පැන් ඒෂියා බැංකුව	200		-	-	-		-		
සණස සංවර්ධන බැංකුව	200		-	-	-		-		
රාජ්‍ය උකස් හා ආයොජන බැංකුව	200		-	-	-		-		
කාර්ගිලිස් බැංකුව	200		-	-	-		-		
එකතුව	**3,000**	**11**	**45.5**	**100**	**1.52**	**100.0**	**45.5**		

2.4 මූල්‍ය ප්‍රදානයක් මගින් පොහොර සහනාධාරය ලබා දීම

මූල්‍ය අභියෝගවලට සහ කෘෂිකර්මාන්තයට සහාය වීමේ අවශ්‍යතාවයට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා රජය වී ගොවීන් සඳහා සෘජු මූල්‍ය සහනාධාර (මුදල් ප්‍රදාන) ක්‍රමයකට මාරුවෙමින් එහි පොහොර සහනාධාර වැඩසටහන දිගටම කරගෙන යනු ලබයි. 2023/24 මහ කන්නය සහ 2024 යල කන්නය සඳහා ගොවීන්ට හෙක්ටයාරයකට රු. 15,000 ක් ලැබුණු අතර එය ඔවුන්ගේ බැංකු ගිණුම්වලට සෘජුවම තැන්පත් කරන ලදී. කුඹුරු ඉඩම්වල වී වගා කිරීමට සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීමට ගොවීන් තවදුරටත් පෙළඹවීම සඳහා, 2024/25 මහ කන්නය සඳහා සහනාධාරය හෙක්ටයාරයකට රු. 25,000 දක්වා වැඩි කරන ලද අතර, ගොවියෙකුට හෙක්ටයාර දෙකක් සඳහා සහනාධාරය දෙනු ලබයි. කෙසේ වෙතත්, අනෙකුත් ක්ෂේත්‍ර භෝග (OFCs) සඳහා මෙම සහනාධාරය දීම 2024 වැඩසටහනෙන් බැහැර කර ඇත.

සම්පත් කාර්යක්ෂමතාව උපරිම කිරීම සඳහා, ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහාය ඇතිව ආනයනය කරන ලද මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) පොහොර ඉතිරි තොගය භාවිතා කරන ලදී. ධාන්‍ය පිරවීමේ ක්‍රියාවලියේදී එහි තීරණාත්මක කාර්යභාරය සහතික කිරීම සඳහා, භෝග අස්වැන්න වැඩි දියුණු කිරීම සඳහා මෙම තොගය මිශ්‍ර සහ සෘජු පොහොර ලෙස අලෙවි කරන ලදී. ඊට අමතරව, ජාත්‍යන්තර සහයෝගීතාවය යටතේ, ලෝක ආහාර වැඩසටහන (WFP) මගින්,ගොවීන්ට නොමිලේ බෙදා හැරීම සඳහා ප්‍රදානයක් ලෙස MOP පොහොර මෙට්‍රික් ටොන් 55,000 ක් ශ්‍රී ලංකාවට ලැබුණි. රජය මෙම තොගයෙන් 50% ක් වී සහ අනෙකුත් භෝග සඳහා වෙන් කළ අතර, ඉතිරි 50% වැවිලි අංශයට සහාය වෙමින් පොල් වගාව සඳහා වෙන් කරන ලදී.

මෙහි උපායමාර්ගික අරමුණ වූයේ, කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම, කාර්යක්ෂම සම්පත් භාවිතය සහතික කිරීම සහ තිරසාර ගොවිතැන ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා දායක වීමයි.

2.5 ක්ෂුද්‍ර මූල්‍ය කර්මාන්තය සඳහා විස්තීර්ණ නියාමන රාමුවක් ස්ථාපිත කිරීම

2016 අංක 06 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනතේ හිඩැස් පියවා ගැනීම සඳහා නව නියාමන රාමුවක් යෝජනා කරන ලදී. ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත් කෙටුම්පත 2023 ඔක්තෝබර් 09 වන දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර 2023 ඔක්තෝබර් 30 වන දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී. ඉන්පසු එය 2024 ජනවාරි 09 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද නමුත් විශේෂ තීරණය කිරීමේ පෙත්සම් හරහා ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් නීතිමය අභියෝගවලට මුහුණ දෙන ලදී.

ඊළඟ පියවර තීරණය කිරීමට ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුව විසින් පාර්ශවකරුවන්ගෙන් කිහිප වතාවක්ම උපදෙස් ලබා ගන්නා ලදී. 2024 පෙබරවාරි 09 වන දින පැවති කමිටුවේ තීරණය මත පදනම්ව, ගැටළු තක්සේරු කිරීම සහ පනත් කෙටුම්පත සංශෝධනය කිරීම සඳහා සමාලෝචන කමිටුවක් 2024 පෙබරවාරි 16 වන දින පත් කරන ලදී. මෙම කමිටුව මගින් 2024 පෙබරවාරි 26 වන දින අතුරු වාර්තාවක් නිකුත් කල අතර, තවදුරටත් සංශෝධන සඳහා ඇති අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

පසුව, පාර්ශ්වකරුවන්ගේ ගැටළු ඇගයීමට සහ සංශෝධන යෝජනා කිරීමට ක්‍රියාකාරී කමිටුවක් සහ මෙහෙයුම් කමිටුවක් පිහිටුවන ලදී. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සභාපතිත්වයෙන් යුත් ක්‍රියාකාරී කමිටුව සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත වූ අතර ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා පාදක සංවිධානවල ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ සහ පාර්ශ්වකරුවන්ගේ දෘෂ්ටිකෝණ විශ්ලේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. සංශෝධන අවසන් කිරීම සඳහා පත් කරන ලද මෙහෙයුම් කමිටුවට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (සම සභාපති), නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සම සභාපති) සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ යන ප්‍රධාන නිලධාරීන් තිදෙනෙකු ඇතුළත් විය.

2024 දෙසැම්බර් 31 වන දින වන විට, ක්‍රියාකාරී කමිටුව තුන් වතාවක් රැස් වූ අතර, ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය සඳහා සංශෝධන සහ ඇතුළත් කල යුතු නියාමන රාමුවක් සහිත වාර්තාව මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා අවසන් කරමින් සිටින ලදී.

2.6 ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම

කුකුළු මස්, කිරි සහ බිත්තර ශ්‍රී ලංකාවේ වඩාත්ම විශ්වාසදායක සහ පහසු ප්‍රෝටීන් ප්‍රභවයන් අතර වේ. කෙසේ වෙතත්, කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදන පිරිවැයෙන් 80-90% ක් සත්ව ආහාර සඳහා ආරෝපණය කර ඇති අතර, සම්මත-ගුණාත්මක ආහාර නිෂ්පාදනය කිරීම සඳහා අවම වශයෙන් බඩ ඉරිඟු වලින් 40% ක් අවශ්‍ය වේ.

වෙළඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා, බලපත්‍රලාභී ආහාර නිෂ්පාදකයින් සහ සංගම් හරහා 2024 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ රජය විසින් මෙට්‍රික් ටොන් 300,000 ක් ආනයනය කිරීම අනුමත කර ඇත. ප්‍රමාණවත් ආහාර සැපයුමක් සහතික කරමින් වෙළඳපල විකෘති කිරීම් සහ හැසිරවීම් වැළැක්වීම මෙම පියවරේ අරමුණයි. මීට අමතරව, මිල නියම කිරීම නියාමනය කිරීම සඳහා, බඩ ඉරිඟු වල වෙළඳපල මිල කිලෝග්‍රෑමයකට රු. 150 ඉක්මවන්නේ නම් ආනයන බලපත්‍ර නිකුත් කිරීම සීමා කරනු ලැබේ.

මෙම උපායමාර්ගික තීරණ කුකුළු මස් සහ කිරි කර්මාන්ත ස්ථාවර කිරීම, පාරිභෝගිකයින් සඳහා දැරිය හැකි සහ තිරසාර ප්‍රෝටීන් ප්‍රභවයන් සහතික කිරීම සහ දේශීය නිෂ්පාදකයින්ට සහාය වීම අරමුණු කර ගෙන ඇත.

2.7 අඩු ආදායම්ලාභී පවුල් වෙත සහල් බෙදාදීම

රට තුළ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් අවදානම් සහගත පවුල් ආරක්ෂා කිරීමේ අරමුණින් 2024 දී 'අඩු ආදායම්ලාභී පවුල් වෙත සහල් බෙදා දීමේ' වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ, හැකියාව සහිත සහල් සැපයුම්කරුවන්ගෙන් නාඩු සහල් මිලදී ගෙන කාණ්ඩ 06 ක් යටතේ හඳුනාගත් අඩු ආදායම්ලාභී පවුල් ආවරණය වන පරිදි එක් පවුලක් සඳහා මසකට සහල් කිලෝග්‍රෑම් 10 බැගින් මාස දෙකක් (02) ක් සඳහා සහල් ලබාදීමට පියවර ගන්නා ලදී.

ඒ අනුව, හඳුනාගත් අඩු ආදායම්ලාභී පවුල් වෙත මාස 2 ක කාලයක් සඳහා සහාය ලබාදීමේ අරමුණින්, මෙම වැඩසටහන දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ, දිස්ත්‍රික්ක 25 ක අඩු ආදායම්ලාභී පවුල් 3,334,976 ක් වෙත සහල් මෙට්‍රික් ටොන් 66,571 ක් බෙදා දෙන ලදී. මෙම වැඩසටහන සඳහා භාවිතා කරන ලද මුළු අරමුදල් ප්‍රමාණය රු. මිලියන 12,790 ක් පමණ විය.

2.8 වී මිලදී ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් වෙත ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

පසුගිය වර්ෂවල අත්දැකීම්වලට අනුව, ගොවීන්ගේ වී අස්වැන්න සඳහා සාධාරණ මිලක් ලබා දෙන අතරම, රට තුළ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් විසින් අගනා කාර්යභාරයක් ඉටුකරමින් පවතී. කෙසේ වෙතත්, පවත්නා වෙළෙඳපොළ පොළී අනුපාතය යටතේ මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශවීමට ඇති සීමිත හැකියාව මෙම සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් අඛණ්ඩව මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් ලෙස හඳුනාගෙන ඇත. එබැවින්,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අවම සහතික මිලකට 2023/2024 මහ කන්නයේ සහ 2024 යල කන්නයේ වී අස්වනු මිලදී ගැනීමට හැකි වන පරිදි වී මෝල් හිමියන්, වී ගබඩා හිමියන් සහ වී තොග රැස්කරන්නන් හට සහන පොළී අනුපාතයක් යටතේ ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් රජය විසින් බැංකු හරහා ක්‍රියාත්මක කරන ලදී.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 2023/2024 මහ කන්නයේ දී රු. මිලියන 3,213ක් වටිනා ණය පහසුකම් 159ක් ලබාදී ඇති අතර මෙම කන්නයේදී වාර්ෂික සඵලදායී පොලී අනුපාතය වූ සියයට 15න් සියයට 4 ක් අදාළ බැංකුවලට පොළී සහනාධාරයක් ලෙස මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලදී. ඒ අනුව, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ වාර්ෂිකව සියයට 11ක පොළී අනුපාතයක් පමණක් ණය ගැනුම්කරුවන් විසින් දරන ලදී. එසේම, 2024 යල කන්නයේදී, රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම බැංකු විසින් සියයට 13ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රුපියල් මිලියන 5,486 ක් වටිනාකම සහිත ණය පහසුකම් 259 ක් මෙම ඔඩපණ ණය වැඩසටහන යටතේ ලබා දෙන ලදී. මෙම ණය සඳහා අයකරන පොළීයෙන් සියයට 4 ක පොලී අනුපාතයක් මහා භාණ්ඩාගාරය විසින් අදාළ බැංකුවලට පොලී සහනාධාරයක් ලෙස ගෙවන ලදී. ඒ අනුව, අදාළ ණය ගැණුම්කරුවන්ට ගෙවීමට සිදු වූයේ සියයට 9 ක වාර්ෂික පොළී අනුපාතයක් පමණි. ඔඩපණ ණය යෝජනා ක්‍රමය යටතේ 2024 දී බැංකු වෙත ගෙවන ලද මුළු පොළී සහනාධාරය රුපියල් මිලියන 62 කි.

2.9 බලපත්‍රලාභී බැංකුවල රන් භාණ්ඩ උකස් කර ඇති පුද්ගලයින්ට සහන සැලසීම

2024 අගෝස්තු මස පලමුවන දින සිට ක්‍රියාත්මක වන පරිදි, අස්වැසුම වැඩ සටහනේ ප්‍රතිලාභීන් විසින් බලපත්‍රලාභී බැංකුවකින් ලබා ගන්නා ලද උකස් අත්තිකාරම් සඳහා පොලී සහනාධාරයක් ලබා දීම සඳහා රජය විසින් සහන වැඩසටහනක් හඳුන්වා දී ඇති අතර එම වැඩසටහන බලපත්‍රලාභී බැංකුවලින් ආරම්භ කරන ලදී . මෙම යෝජනා ක්‍රමය සඳහා 2024 ජූනි 30 දිනට ක්‍රියාකාරී අත්තිකාරම් ලෙස වර්ගීකරණය කර ඇති රු. 100,000 නොඉක්මවන උකස් අත්තිකාරම් සඳහා වාර්ෂිකව 10% දක්වා පොලී සහනාධාරයක් ලබා දෙනු ලැබේ.

2.10 ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (ICL) ඇමරිකානු ඩොලර් මිලියන 1,000

ශ්‍රී ලංකා රජය (GoSL) සහ ඉන්දියානු රාජ්‍ය බැංකුව (SBI) අතර ණය පහසුකම් ගිවිසුම 2023 මාර්තු 16 දක්වා ඉන්දියාවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීමට ඩොලර් මිලියන 1000 ක ණයක් ලබා ගැනීම සඳහා 2022 මාර්තු 17 වන දින අත්සන් කරන ලදි. 2022 මාර්තු 05 වැනි දින පැවති රැස්වීමේදී ලබා දුන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ බැංකු පද්ධතියේ සහ වෙළෙඳපොළේ විදේශ මුදල් හිඟය හේතුවෙන් ආහාර සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමේ දුෂ්කරතාවන්ට මුහුණ දුන් ශ්‍රී ලාංකික ආනයනකරුවන්ට පහසුකම් සැලසීම මෙම ගිවිසුමේ අරමුණ විය. එකල පැවති ආර්ථික අර්බුදය සහ රටේ ආර්ථිකය නංවාලීමට උපකාරී වන සාධක විශ්ලේෂණය කිරීමෙන් පසු කාර්මික අමුද්‍රව්‍ය, අත්‍යවශ්‍ය භාණ්ඩ, ඖෂධ සහ ඉන්ධන යන අංශ අතර ණය පහසුකම් වෙන් කර ඇත. 2023 මැද භාගයේදී පැන නැගුනු කරුණු සැලකිල්ලට ගනිමින්, ඉන්දියානු රාජ්‍ය බැංකුව විසින් ප්‍රයෝජනයට නොගත් මුදල සහ ඖෂධ ද්‍රව්‍ය ආනයනය කිරීමේ වැඩිදුර අවශ්‍යතා සඳහා ඉතිරි අරමුදල් භාවිතා කිරීමේ අවසාන දිනය 2024 මාර්තු 16 දක්වා දීර්ඝ කිරීමට ඉන්දියානු රාජ්‍ය බැංකුව SBI විසින් 2023 ජූනි 07 වන දින දීර්ඝ කිරීමේ ගිවිසුම අත්සන් කිරීමෙන් එකඟ විය. ඉන් අනතුරුව 2024 මාර්තු 18 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහා සූර්ය පැනල ආනයනය කිරීම වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 17ක් වෙන් කිරීමට අමාත්‍ය මණ්ඩලයට අනුමැතිය ලබා දුන් අතර මූලික වශයෙන් ඉන්දියානු රාජ්‍ය බැංකුව මෙම ණය යෝජනාක්‍රමයේ මෙහෙයුම් කටයුතු 2025.03.16 දක්වා අඛණ්ඩව පවත්වාගෙන යාමට එකඟ විය.

ඒ අනුව, 2024 දෙසැම්බර් 31 වන දින වන විට ඇමරිකානු ඩොලර් මිලියන 481 ක් ඉන්දියානු රාජ්‍ය බැංකුව විසින් ලබා දී ඇති අතර එයින් 99.5% වන ඩොලර් මිලියන 478.7 ක් අපනයනකරුගේ ගෙවීම් අනුමැතිය සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය වෙත නිකුත් කර ඇත. 2024 දෙසැම්බර් 31 දිනට එක් එක් අංශයේ ප්‍රගතිය පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

2024.12.31 දිනට ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේ ප්‍රගති සාරාංශය

ඇ. ඩො. මි.

#			
1	**එකඟවූ මුළු මුදල**		**1,000.00**
2	**ලබා දුන් මුළු මුදල**		**481.00**
3	**පරිහරණය කරන ලද මුළු මුදල (ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කරන ලද)**		**478.72**
	අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය	78.35	
	ඖෂධ	139.66	
	කාර්මික අමුද්‍රව්‍ය	43.72	
	ඉන්ධන	200.00	
	සූර්ය පැනල	16.99	
4	**2024.12.31 දිනට ඉතිරි මුදල**		**2.28**

2.11 සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය (NCGIL)

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා සහාය වීමේ අරමුණින් පොදු සීමිත සමාගමක් ලෙස සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය පිහිටුවන ලදී. එහි මූලික අරමුණ වන්නේ වේගයෙන් වෙනස්වන වෙළඳපොළ ඉල්ලුමට අනුවර්තනය වීම, පරිණාමය වෙමින් පවතින තාක්ෂණය සහ අඩු මූල්‍ය ඇතුළත් කිරීම්, මූල්‍ය සඳහා සීමිත ප්‍රවේශය සහ විශේෂයෙන් පිළිගත හැකි ඇපකර නොමැතිවීම හේතුවෙන් ඇතිවන ධාරිතා සීමාවන් වැනි අභියෝග ජය ගැනීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහය වීමයි.

මෙම මුලපිරීම පහසු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු 10ක් සහ බලපත්‍රලාභීනොවන මූල්‍ය සංස්ථා 3කින් සමන්විත සහභාගීත්ව මූල්‍ය ආයතන 13ක් ආරම්භක කොටස් හිමියන් ලෙස තෝරාගෙන ඇත.

සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයෙහි ආරම්භක ප්‍රාග්ධනය සඳහා ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා රජයට ඇමරිකානු ඩොලර් මිලියන 50ක ණයක් ලබා දී ඇති අතර අනෙකුත් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් කොටස් ප්‍රාග්ධනයෙන් 10%ක් දායක කර ඇත. සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය 2024 වර්ෂයේදී ඇපකර නිකුත් කිරීම ආරම්භ කර ඇත.



පී. එම්. කේ. හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

03 පරිච්ඡේදය– 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	සත්‍ය 2,024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර ප්‍රතිපාදන		68,641,500,000	19,532,080,946	ඒසීඒ-3
-	තැන්පතු		9,540,071,207	35,935,400,141	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		5,986,377	3,537,751	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		78,187,557,584	55,471,018,847	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		78,187,557,584	55,471,018,847	
	භාණ්ඩාගාරයට පේෂණ (ඈ)		10,373,236,419	35,935,236,311	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		67,814,321,165	19,535,782,536	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
55,098,400	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	55,226,349	50,306,065	ඒසීඒ-2(ii)
37,227,500	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	21,766,512	13,680,219	
53,150,251,100	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	57,660,334,463	20,225,487,607	
-	පොලී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
58,242,577,000.00	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		57,737,327,324	20,289,473,890	
	මූලධන වියදම්				
1,100,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	-	324,050	ඒසීඒ-2(i)
20,500,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	2,479,537	628,730	
334,300,000.00	මූලධන මාරුකිරීම්	12	170,958,557	1,836,221,342	
60,292,465,000.00	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	35,349,364,201	11,051,391,115	
1,500,000.00	ධාරිතා වර්ධනය	14	847,029	242,050	
1,700,000.00	වෙනත් මූලධන වියදම්	15	415,363	943,105	
60,671,565,000.00	මුළු මූලධන වියදම් (උ)		35,330,870,537	12,890,150,791	
	තැන්පතු ගෙවීම්		13,207,365,247	46,956,502,599	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		6,265,344	3,193,725	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		13,213,533,591	46,959,696,323	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		105,887,131,852	80,139,321,005	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(37,867,010,683)	(60,603,538,469)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(37,867,010,588)	(60,603,538,469)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		184,337		ඒසීඒ-3
			(37,866,826,251)	(60,603,538,469)	

1

Scanned with CamScanner

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2,024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,765,973,710	1,765,928,144
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	6,826,310	6,544,343
ඉන්දියානු ණය සැපයුම් ගිණුම		2,194,612,141	
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	184,237	-
මුළු වත්කම්		3,967,616,398	1,772,472,487
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		631,207,869	(5,231,384,516)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,765,973,710	1,765,928,144
කුලී හා වැ.වි අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	1,570,434,819	5,237,928,859
අයිරා ශේෂය	ඒසීඒ-3		-
මුළු වගකීම්		3,967,616,398	1,772,472,487

පිටු අංක 06 සිට 49 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ආමුණුම් පිටු අංක 50 සිට 51 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම වෙසත් ගිණුම්වල අනිවාර්ය කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 චක්‍රලේඛයට අනුකූලව සිදුකර ඇත. ඉහත දැක්වෙන ගිණුම්වල සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඊ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වගකීම් වන කාර්යාලවල සීමාවන් පවත්නා බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
නම: කේ.එම්.මහින්ද සිරිවර්ධන	නම :පී.එම්.ජේ. හෙට්ටිආරච්චි	නම :ඩබ්ලිව්.පී.පී.එස්.ජයවර්ධන
තනතුර :ලේකම්,මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	තනතුර :අධ්‍යක්ෂ ජනරාල්	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
29.05.2025	දිනය : 28.05.2025	දිනය : 28.05.2025
කේ.එම්.මහින්ද සිරිවර්ධන මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් මුදල් අමාත්‍යාංශය කොළඹ 01.	පී. එම්. ජේ. හෙට්ටිආරච්චි අධ්‍යක්ෂ ජනරාල් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01	ඩබ්.පී.පී.එස්. ජයවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය කොළඹ 01.

2

Scanned with CamScanner

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-3

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
මුළු බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		2,933,931	2,958,041
අග්‍රිම ලැබීම්		68,641,500,000	19,532,080,946
අත්තිකාරම් අයකර ගැනීම්		3,768,517	2,648,302
තැන්පතු ලැබීම්		9,540,071,207	35,935,400,141
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		78,188,273,654	55,473,087,430
<u>අඩුකළා : මුදල් වැය කිරීම</u>			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		76,431,279	63,531,684
සහනාධාර සහ මාරුකිරීම්		57,043,078,671	19,161,323,008
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		10,373,052,182	35,935,236,311
අත්තිකාරම් ගෙවීම්		4,239,567	1,707,136
තැන්පතු ගෙවීම්		383,437,294	251,525,618
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		67,880,238,992	55,413,323,757
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		10,308,034,662	59,763,673
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
පොළී		-	-
ලාභාංශ		-	-
පිහිටුම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උප ණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම</u>			
ප්‍රාග්ධන වියදම්		10,307,850,425	59,763,673
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		10,307,850,425	59,763,673
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)		(10,307,850,425)	(59,763,673)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		184,237	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම</u>			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)		184,237	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		184,237	-

3

Scanned with CamScanner

3.4 මූල්‍ය ප්‍රකාශන සටහන්

3.4.1 වාර්තා කිරීමේ පදනම

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) <u>ගිණුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට සහතිකයක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති ශේෂය වාණිජ මුදල් ගෝලීය සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආයතනවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* සෑම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟින් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

5

Scanned with CamScanner

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝග ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ග	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	25,905,030,000	58,242,577,000	57,137,427,324	98%
ප්‍රාග්ධන	44,185,900,000	60,671,565,000	35,330,070,937	58%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල %ලෙස
			මුදල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	අදාළ නොවේ					

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය %ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	5,194,600	5,194,600	---	---
9152	යන්ත්‍රෝපකරණ	89,565,447	89,565,447	---	---
9153	ඉඩම්	---	---	---	---
9154	අස්පෘශ්‍ය වත්කම්	1,734,450	1,734,450	---	---
9155	ජීව විද්‍යාත්මක වත්කම්	---	---	---	---
9160	කෙරීගෙන යන වැඩ	1,669,479,213	1,669,479,213	---	---
9180	බදු දෙන ලද වත්කම්	---	---	---	---

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/E/DDF/FS/24/14 ඔබේ අංකය / உமது இல. / Your No. }　　　දිනය / திகதி / Date } 2025 ජුනි දින

ගණන්දීමේ නිලධාරී
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

Scanned with CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3 කරුණු අවධාරණය කිරීම

(i) මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත.

(ii) බැඳීම් හා බැරකම්වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශන වල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (ඇමුණුම iii) කෙරෙහි අවධානය යොමු කරවමි. 2024 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා වන ණය යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු හිඟ ණය පොළිය රු.55,728,440,383ක් හා නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු හිඟ ණය පොළිය රු.844,600,604ක් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නොකර බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි සටහනක් මඟින් හෙළිදරව් කර තිබුණි.

මෙම කරුණු සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

2

Scanned with CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3

Scanned with CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.48,823,212,000 ක් වූ මුල් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 163 දක්වා පරාසයකින් පරිපූරක ඇස්තමේන්තු මගින් අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 06 ක ප්‍රතිපාදනයෙන් එකතුව රු.1,065,155,600 ක් සියයට 0 සිට 19 දක්වා පරාසයකින් ප්‍රතිපාදන අඩු කිරීම් ද, පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 14 ක එකතුව රු. 1,065,155,600 ක් සියයට 1 සිට 264 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වැඩි කිරීම් ද මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කිරීම මගින් සිදු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මුලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් රහිත පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 05 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු හා මුදල් රෙගුලාසි 66/69 යටතේ එකතුව රු. 16,185,132,600 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ඈ) සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 27ක් සඳහා සලසා තිබූ එකතුව රු. 35,173,468,000 ක ප්‍රතිපාදන වලින් එකතුව රු. 23,677,747,194 ක් වූ ප්‍රතිපාදන වැය නොකර ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 සිට සියයට 100ක් දක්වා වූ පරාසයක පැවතුණි.

(ඉ) SME Credit Line ව්‍යාපෘතියට අදාලව වැය විෂය අංක 243-02-02-18-2302(11) සඳහා 2024 වර්ෂය සඳහා ලබාදුන් ප්‍රතිපාදන සීමාව ඉක්මවා අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුල රු.305,664,515ක ගෙවීම කර ඒ සඳහා මු.රෙ.66 මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර 2025 ජනවාරි 25 දින අනුමැතිය ලබාදී තිබුණි.

3.2 බැරකම් හා බැදීම් වලට එළඹීම

(අ) මු.රෙ 94 (2) ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා බැරකම් ලෙස බැදිය හැකි හිඟ ණය ඉපාළිය ගතවූ තුන් අවුරුද්ද තුළ ප්‍රතිපාදනය කරන ලද මුදල් ප්‍රමාණයේ සාමාන්‍යයෙන් සියයකට 50 සීමාව වූ රු.9,310,916,667ක් විය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එම සීමාව ඉක්මවා රු.46,417,523,716ක් හිඟ ණය පොළිය වෙනුවෙන් බැරකම් වලට බැදී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල වැය විෂයයන් 08ක එකතුව රු.17,930,681ක් වූ ගෙවීම් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන තුල අඩංගු විය යුතු ඇමුණුම් iv බැරකම් පිළිබඳ ප්‍රකාශය I ආකෘති පත්‍රය මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කර ගිණුම් වර්ෂයට අදාල මු.රෙ.94(2) හා (3) ප්‍රකාරව එළඹෙන ලද බැරකම් සඳහන් කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි.

4

Scanned with CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බව හා එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණද එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නියදි පරීක්ෂාව අනුව, මු.රෙ.137 ප්‍රකාරව ගෙවීම් අනුමත කිරීමේ නිල මුද්‍රාව යොදා අනුමත කිරීමේ නිලධාරියා විසින් අත්සන් නොකළ එකතු වටිනාකම රු.4,873,397,056 ක් වූ වවුචර්පත් 03ක් පැවතුණි.

3.5 තැන්පතු

(අ) දෙපාර්තමේන්තුවේ අංක 6000-0-0-013-0-186-0 දරන පොදු තැන්පත් ගිණුමෙහි ගෙවීම් නිරුවෙහි ශේෂය රු.382,569,939ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව එය රු.13,206,697,892 ක් වුයෙන් රු.12,824,127,953ක වෙනසක් පැවතුණි.

(ආ) මු.රෙ.571 (2) හා (3) ප්‍රකාරව ඉකුත් වූ සියලුම තැන්පතු අදාල ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට කටයුතු කළ යුතු වුවද, අංක 6000-0-0-013-0-186-0 තැන්පතු ගිණුමේ රු.1,077,683ක ශේෂයක් වසර 02 ඉක්මවා පැවතුණි.

3.6 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

විසර්ජන පනතින් බලය දෙනු ලැබූ දෙපාර්තමේන්තුවේ උපරිම හර ශේෂ සීමාව රු.12,000,000ක් වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයේදී සත්‍ය සීමාව රු.7,015,393ක් වී තිබූ අතර ළඟා නොවූ උපරිම හර ශේෂ සීමාව රු.4,984,607ක් හෙවත් අනුමත සීමාවෙන් සියයට 42ක් වී තිබුණි. ඒ අනුව, අදාල ඇස්තමේන්තු තාත්වික පදනමින් පිළියෙල කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 මූල්‍ය සහන ණය යෝජනා ක්‍රියාත්මක කිරීම

කාබනික පොහොර සහ කාබනික පළිබෝධනාශක, වල් නාශක නිෂ්පාදකයින් සඳහා ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමය යටතේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ආයතන 03 ක් වෙත දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතු රු. 1,364,636 ක් වූ ණය පොළිය නිරවුල් නොකර හිඟව පැවතුණි.

Scanned with CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

4.2 ප්‍රසම්පාදනයන්

රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අත්තිත්ව මිල සැසඳුම් ක්‍රමයට ප්‍රසම්පාදන කිරීමේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කළ යුතු බව දක්වා තිබුණද, දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර 2024 වර්ෂයේ අවස්ථා 04 ක දී එකතුව රු. 658,442 ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් වෙළඳපොළ මිල සැසඳුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

WP CAD – 4869 අංක දරන මෝටර් රථයේ ධාවන සටහන් අනුව අවසන් වරට 2024 මැයි මස 29 වන දින ධාවනය කර තිබූ මෙම රථය විගණන අවස්ථාව වන 2025 අප්‍රේල් 10 දින වන විටත් අලුත්වැඩියා කටයුතු සිදු නොවීමෙන් වර්ෂයකට ආසන්න කාලයක් නිෂ්ක්‍රියව පැවතුණි.

5. මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අනුයුක්ත කාර්ය මණ්ඩලය හා සත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳව පහත තොරතුරු අදාල වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	23	16	07
තෘතීයික	01	01	-
ද්විතීයික	23	20	03
ප්‍රාථමික	12	11	01
එකතුව	59	48	11

සමාලෝචිත වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 59 න් තනතුරු 11ක් හෙවත් මුලු තනතුරු වලින් සියයට 19 ක් පුරප්පාඩුව පැවති අතර මේ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 23 න් තනතුරු 07ක් හෙවත් සියයට 30 ඇතුළත්වී තිබුණි.

ඩී.පී.ඒ.එස්. අතුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

6

Scanned with CamScanner

04 පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

නිශ්චිත දර්ශක	අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය		
	100% - 90%	75% - 89%	50% - 74%
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ව්‍යාපෘතිය සඳහා නිකුත් කරන ලද ණය සංඛ්‍යාව	94%		
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය සඳහා නිකුත් කරන ලද ණය සංඛ්‍යාව (පළමුවන අත්තිකාරම)		83%	
කුඩා තේ වතු හිමියන් සඳහා වන ණය යෝජනාක්‍රමය	100%		
දරිද්‍රතාවය අවම කිරීම සඳහා ජපන් අරමුදල් ප්‍රදානය	100%		
ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත සවිබල ගැන්වීම			70%
ඔඩපණ ණය යෝජනා ක්‍රමය 2023/2024 මහ කන්නය 2024 යල කන්නය	 --- 92%	 --- ---	 36% ---
අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම	100%	---	---

05 පරිච්ඡේදය – තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය (SDGs)

5.1. හැදින්වීම

තිරසාර සංවර්ධනයේ මූලික පරමාර්ථය වන්නේ ජාතියක ස්වභාවික සම්පත් වර්තමානයේ ඵලදායී ලෙස කළමනාකරණය කරමින් අනාගත පරපුර සඳහා සංරක්ෂණය කිරීමයි. මේ අනුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන 2015 දී එළිදක්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක 17(SDG), 2030 වන විට සාමාජික රටවල් 193ක් විසින් ඉටු කිරීමට නියමිත අතර ක්ෂේත්‍ර 17ක් පුරා විහිදේ. එබැවින්, මානව, සමාජීය, ආර්ථික සහ පාරිසරික අංගවල මූලික කුළුණු එකිනෙක සම්බන්ධ කිරීමෙන්, පාරිසරික තිරසාරත්වය, සමාජ තිරසාරභාවය සහ ආර්ථික සංවර්ධනය තුළින් තිරසාර සංවර්ධනයක් කරා ආර්ථිකයන් මෙහෙයවීම මෙහි ඉලක්කය වේ. රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ එක්ව, වසර 2030 වන විට තිරසාර සංවර්ධනයේ අභිමතාර්ථ සහ ඉලක්ක සපුරාලීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගනිමින් සිටී.

ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආයෝජන කඩිනම් කිරීම, ප්‍රමුඛතා අංශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සංවර්ධන උපාය මාර්ග මෙහෙයවීම SDG හි ප්‍රමුඛතම හා පළමු ඉලක්කය වන "සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරුකිරීම" යන ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය වේ." ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ තීරණාත්මක උපායමාර්ගික අංශයක් ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වැදගත්කම අවබෝධ කර ගනිමින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ඒ සඳහා රජයේ දායකත්වය ලබා දීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශයේ වැඩසටහන් කිහිපයක් දියත් කර ඇත.

රටේ ආර්ථික සංවර්ධනයට සවිබල ගැන්වීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) අංශයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් විශේෂිත වැඩසටහන් කිහිපයක් ආරම්භ කර ඇත. ඒ අතරින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම (SMELoC) ව්‍යාපෘතිය සහ රාජ්‍ය අරමුදල් වලින් පිරිනමන ලද " ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත ශක්තිමත් කිරීමේ" ණය සැලසුම මගින් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා විශේෂිත මූල්‍යමය සහය ලබා දී ඇත. තවත් එක් වැදගත් පියවරක් වශයෙන්, ව්‍යාපාරවලට ණය ලබා ගැනීමේ අභියෝග අඩු කිරීම සඳහා ජාතික ණය සුරකුම් ආයතනය (NCGIL) පිහිටුවා ඇත. මීට අමතරව, කාන්තා ව්‍යාපාරිකයින් සඳහා මූල්‍ය ප්‍රවේශය වර්ධනය කිරීම, හා සමානත්වයෙන් යුතු ආර්ථික පරිසරයක් උදෙසා "කාන්තා නායකත්වය යටතේ පැවති ව්‍යාපාර" සඳහා සහය සැලසීමක් ද සිදු කර ඇත.

මෙලෙස ශ්‍රී ලංකාව, SDG සංවර්ධන ඉලක්ක වලට අනුකූලව තම සංවර්ධන මූල්‍ය ප්‍රායෝගිකව ගැලපීම හරහා සියලුම පුරවැසියන් සඳහා ස්ථාවර සහ සමානත්වයෙන් යුතු අනාගතයක් උදෙසා දැඩි පියවර ගෙන ඇත.

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්යසාධනය

5.2.1. හඳුනාගත් තිරසාර සංවර්ධන ඉලක්ක

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75% - 100%
අරමුණ 02 කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව ලඟාකරගැනීම සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර	2.4 2030 වන විට, තිරසාර ආහාර නිෂ්පාදන පද්ධති සහතික කිරීම සහ තිරසරබව සහ නිෂ්පාදනය වැඩි කරන, පරිසර පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන, දේශගුණික විපර්යාසවලට	2.4.1 ඵලදායී හා තිරසාර කෘෂිකර්මය යටතේ වන කෘෂිකාර්මික සමානුපාතිකය.	**නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 83,185 2024 වසරේ පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල : රු. මිලියන 250		

කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම	අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කරන, ආන්තික කාලගුණය, නියඟය, ගංවතුර සහ වෙනත් ආපදාවලට අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කරන සහ ක්‍රමානුකූලව ගොඩබිම සහ පස වැඩිදියුණු කරන හා ඔරොත්තු දෙන කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.		**"රන් අස්වැන්න" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 7,970 ණය මුදල : රු. මිලියන 11,469.3 2024 වසරේ පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල : රු. මිලියන 222.75 **"ගොවි නවෝදා" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 1451 ණය මුදල : රු. මිලියන - 682.4 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල : රු. මිලියන 20.78 **ගබඩා පහසුකම්** අස්වැන්න නෙලන කාලය තුල ධාන්‍ය වල මිල පහළ යන බැවින් අස්වැන්න නොමැති කාලයේ ධාන්‍ය සඳහා ඉහළ මිලක් ලබා ගැනීම අරමුණු කරගනිමින් වී, බඩ ඉරිඟු, සෝයා බෝංචි, තල, උඳු, ගම්මිරිස්, රටකජු හා අනෙකුත් භෝග ගබඩා කිරීම සඳහා අනුරාධපුර, බුත්තල, මන්නාරම, කිලිනොච්චිය සහ පොළොන්නරුව යන ප්‍රදේශවල දළ වශයෙන් මෙට්‍රික් ටොන් 17,200ක ඒකාබද්ධ ගබඩා ධාරිතාවක් සහිත ගබඩා පහක් ඉදිකර ඇත. 2024 වර්ෂය තුලදී ගබඩා කර ඇති මුළු ධාන්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4,404කි. සූර්ය බලශක්තිය නිෂ්පාදනයෙන් ලැබෙන ආදායම ඇතුළුව ගබඩා පහසුකම් සැපයීමෙන් උපයන ලද රාජ්‍ය ආදායම රුපියල් මිලියන 25කි. ගබඩා ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ වැඩසටහන යටතේ සහනදායී ණය ලබා ගත් මුළු ගොවීන් සංඛ්‍යාව සහ මුළු ණය මුදල

			පිළිවෙලින් 456ක් සහ රුපියල් මිලියන 257.7කි. **2023/2024 මහ කන්නයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම** බෙදාදෙන ලද සහල් ප්‍රමාණය - මිලියන 3.33 ක් පමණ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් මෙට්‍රික් ටොන් 66,571 (ප්‍රගතිය- සියයට 100) මහා භාණ්ඩාගාරය හරහා සපයන ලද අරමුදල් - රු. මිලියන 12,790. (ප්‍රගතිය - සියයට 100) **ඔඩපණ ණය යෝජනා ක්‍රමය** ලියාපදිංචි කරන ලද මුළු ණය සංඛ්‍යාව 2023/2024 මහ කන්නය - 159 2024 යල කන්නය - 259 මුළු ණය වටිනාකම 2023/2024 මහ කන්නය - රු. මිලියන 3,213 2024 යල කන්නය - රු. මිලියන 5,486
අරමුණ 04 පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	4.2 වසර 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමඟින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම.	4.2.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව සෞඛ්‍යමය, ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවු. 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය	**"සිගිති පාසල" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 62 ණය මුදල : රු. මිලියන 63.4 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල : රු. මිලියන 1.94 **"රැකවරන" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 9 ණය මුදල : රු. මිලියන 44.4 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 1.05

	4.7 වසර 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුලත් වේ.	4.7.1 ගෝලීය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ මානව හිමිකම් (අ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් (ආ) විෂය මාලාවන් (ඇ) ගුරු අධ්‍යාපනය සහ (ඇ) ශිෂ්‍ය ඇගයීම් යන සියළු මට්ටම්වල දී ප්‍රවාහානුගතව පැවතීම ඇතුළත් තිරසර සංවර්ධනය සඳහා වන ඉගෙනුම.	**"මගේ අනාගතය" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 729 ණය මුදල : රු. මිලියන 650.5 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 68.58 **"ඇරඹුම" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 175 ණය මුදල : රු. මිලියන 230.99 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 6.33
අරමුණ 5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.	5.1 කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලු ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම.	5.1.1 ස්ත්‍රී පුරුෂ භාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම් ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවත්නේද නැද්ද යන්න.	**කාන්තා මූලික ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රමය** **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (SMELOC)** ලබා දුන් ණය ප්‍රමාණය: 268 ණය මුදල: රුපියල් මිලියන 2,687 **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (SMELOC2)** ලබා දුන් ණය ප්‍රමාණය: 265 ණය මුදල: රුපියල් මිලියන 1,166
අරමුණ 7 සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම.	7. ආ) වසර 2030 වන විට විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අනෙකුත් රටවල දේශ සීමාවන්ගෙන් ආවරණය වූ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඇතුලත්ව සියලුම සංවර්ධනය වන රටවල ඔවුන්ගේ වැඩසටහන්	7. ආ 1) දළ දේශීය නිෂ්පාදනයේ සහ තිරසර සංවර්ධන සේවා සඳහා වන යටිතල පහසුකම් සහ තාක්ෂණය පිණිස වන මූල්‍ය හුවමාරුව පිණිස වන සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයට අනුපාතව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ආයෝජන.	**"රිවි බල සවිය" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 453 ණය මුදල : රු. මිලියන 157.6 2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 1.15

	සැලසුම් වලට අනුකූලව නවීන සහ තිරසර බලශක්ති සේවා සැපයීම සඳහා යටතල පහසුකම් ව්‍යාප්ත කිරීම සහ තාක්ෂණය වැඩි දියුණු කරීම.		
ඉලක්කය 8 සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා පුවර්ධනය කිරීම	8.3 ඵලදායී ක්‍රියාකාරකම්වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලී භාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තියෙන් ප්‍රවර්ධනය කිරීම මූල්‍ය සේවාවන්ට ප්‍රවේශවීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිහිටුවීම් සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම	8.3.1ස්ත්‍රී පුරුෂ භාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තියේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය	**I සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමය** ලබා දුන් ණය ප්‍රමාණය: 653 ණය මුදල: රුපියල් මිලියන 7,588 **II කුඩා තේ වතු හිමියන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය** ලබා දුන් ණය ප්‍රමාණය: 872 ණය මුදල: රුපියල් මිලියන 1,488 **III සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමය (SMELOC2)** ලබා දුන් ණය ප්‍රමාණය: 912 ණය මුදල: රුපියල් මිලියන 5,608.8 **"ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 1,000 ණය මුදල : රු. මිලියන 21,357.4 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 818.89 **"හරිත ණය" යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 242 ණය මුදල : රු. මිලියන 791.5 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 41.91 **"දිරි සවිය" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 572

			ණය මුදල : රු. මිලියන 413.3 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 9.79 **"රිය ශක්ති" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 178 ණය මුදල : රු. මිලියන 613.8 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 14.48 **"මාධ්‍ය අරුණ" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 258 ණය මුදල : රු. මිලියන 76.9 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 0.3 **"සංචාරක පොඩ්ඩෝ" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 1,198 ණය මුදල : රු. මිලියන 538.46 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 2.66 **"සිටි රයිඩ්" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 8 ණය මුදල : රු. මිලියන 52.1 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 0.51

අරමුණ 11 නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	11.1) 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරි සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම.	11.1.1) පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත් වන නාගරික ජනගහනයේ ප්‍රමාණය.	**"සොඳුරු පියස" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 14,834 ණය මුදල රු. මිලියන : 2,958.3 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 34.90 **"හෝම් ස්වීට් හෝම්" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව: 1,282 ණය මුදල රු. මිලියන : 4,585.2 2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 167.06 **"සිහින මාලිගා" ණය යෝජනා ක්‍රමය** ණය සංඛ්‍යාව : 247 ණය මුදල රු. මිලියන : 1,332.5 2024 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල : රු. මිලියන 24.57

5.2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ සංවර්ධනය

2016 වර්ෂයේදී, ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ආයෝජන ණය ලබා දීම සඳහා , 'සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම ව්‍යාපෘතිය (SMELOC)' ලෙස ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහාය ඇත ඇමරිකානු ඩොලර් මිලියන 175 ක ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. කොවිඩ්- 19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් තවදුරටත් ඇමරිකානු ඩොලර් මිලියන 165 ක මුදලක් 2020 දෙසැම්බර් මස දී ලබා දුනි. ඊට අමතරව, 2022 වසරේ සිට පැවති ආර්ථික පසුබෑම හේතුවෙන් ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි ඇති වූ අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින් , ආසියානු සංවර්ධන බැංකුව රජයේ එකගතාවය ඇතිව SME ණය සංරචකය යටතේ වෙන් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 13.5 මුදලක් කාරක ප්‍රාග්ධන ණය ලබා දිම සඳහා නැවත ලබා දෙන ලදී.

පසුගිය වසර කිහිපය තුළ ඇතිවූ පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය හා රට තුළ සිදුවූ ආර්ථික පසුබෑම වැනි හදිසි කම්පන හේතුවෙන් , සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ව්‍යවසායන්ක කටයුතු දැඩි ලෙස බලපෑමට ලක් වූ අතර, ව්‍යාපාර හිමිකරුවන් තම ව්‍යාපාර නැවත පණ ගැන්වීමට අරගල කරමින් සිටියහ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා 2024 මාර්තු මාසයේදී ආසියානු සංවර්ධන බැංකුව විසින් 'කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීමේ

මූල්‍ය ව්‍යාපෘතිය යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 100 ක් ලබා දෙන ලදී. එයින් ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් හදිසි කම්පන හේතුවෙන් තම ව්‍යාපාරවලට ඇතිවූ අහිතකර බලපෑම් වලින් මිදීම සඳහා කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාර, නිෂ්පාදන, තාක්ෂණය, යන ක්ෂේත්‍ර වල නියුතු කාන්තා මූලික ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හදිසි කාරක ප්‍රාග්ධන මූල්‍යකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා SMELOC2 සංරචකය යටතේ ලබා දෙන ලදී. ඉතිරි ඇමරිකානු ඩොලර් මිලියන 50, ආයෝජන ණය ලබා ගැනීමේදී හදිසි ප්‍රතිචාර පහසුකම (Emergency Response Facility) 2022 ඔක්තෝම්බර් මසදී ප්‍රමාණවත් ඇපකරයක් සැපයීමට අපොහොසත් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායින්ට අර්ධ ණය ඇපකර (PCG) ලබා දීම සඳහා රජයේ කොටස් දායකත්වය ලෙස ජාතික ණය සුරැකුම් ආයතනයේ ආයෝජනය කරන ලදී.

සංවර්ධන හවුල්කරුවන්ගේ මූල්‍ය සහයෝගය මෙන්ම බැංකු විසින් තමන්ගේම අරමුදල් භාවිතා කරමින් සිදු කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි ප්‍රාග්ධන ආයෝජන සඳහා මූල්‍ය අවශ්‍යතා සපුරාලීම ප්‍රමාණවත් නොවූ බැවින්, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත පණගැන්වීම සඳහා උත්තේජනයක් ලෙස නව සහනදායී ණය යෝජනා ක්‍රමයක් රජය විසින් ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා ක්‍රියාකාරී මට්ටමේ පවතින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ආයෝජන ණය ලබා දීම සඳහා රුපියල් බිලියන 16.0 ක් සහ අක්‍රිය ණය කාණ්ඩයේ පවතින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා රුපියල් බිලියන 5.0 ක් යොදවන ලදී. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් විසින් ලබා දෙන අගය එකතු කළ දායකත්වය වැඩි කිරීමේ අරමුණින්, රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක මෙම ණය වැඩසටහන වාර්ෂික වැඩසටහනක් ලෙස මෙම දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කෙරේ.

5.2.3. ආහාර සුරක්ෂිතතාව, පෝෂණය සහ තිරසාර කෘෂිකර්මාන්තය

රට තුළ පවත්නා මූල්‍ය අවපාත තත්වයක් තුල වුව ද, වී නිෂ්පාදනයේ පිරිවැය අඩු කිරීම සඳහා,මූල්‍යමය සීමාවන් සැලකිල්ලට ගනිමින් ගොවීන් සඳහා පොහොර සහනාධාරය සහ මූල්‍යමය සහනාධාර (මූල්‍ය ප්‍රධාන) ලබා දීමට ද රජය තීරණය කර ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහයෝගය ඇතිව, 2022 වර්ෂයේදී ආනයනය කරන ලද, Muriate of Potash (MOP) පොහොර, වෙළඳපොල මිල හා සමාන්තර මිලකට, ගොවීන් වෙත සැපයීමට කටයුතු කළ අතර, ධාන්‍ය මේරීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යයක් වන MOP භාවිතය සහතික කිරීම සඳහා 2024 දී ලෝක ආහාර වැඩසටහන යටතේ ප්‍රධානයක් ලෙස ලැබී තිබූ MOP නොමිලේ බෙදා හරින ලදී. එම තීරණ රටේ ප්‍රධාන ආහාරයට දැරිය හැකි මිලක් සහතික කිරීමට හේතු විය.

පොහොර සහනාධාර වැඩසටහන සඳහා 2024 වසරේදී වෙන් කළ මුළු මුදල රුපියල් මිලියන 38,366 ක් වූ අතර එයින් රුපියල් මිලියන 38,270 ක් වියදම් කරන ලදී.

2024 පොහොර සහනාධාර වැඩසටහන යටතේ සත්‍ය වියදම්

අනු. අංකය	විස්තරය	එකතුව (රු.මි)
1	කාලීන ණය ආපසු ගෙවීම	14,741.73
2	වී වගාව සඳහා පොහොර සහනාධාර ගෙවීම (රසායනික පොහොර)	310.50
3	වී වගාව සඳහා පොහොර සහනාධාර ගෙවීම (කාබනික පොහොර) -	
4	අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා පොහොර සහනාධාර ගෙවීම (රසායනික පොහොර)	
5	පරිහරණ වියදම්	13.36
6	ගොවීන් සඳහා මූල්‍ය සහනාධාරය (මූල්‍ය ප්‍රදානය)	23,205.17
	එකතුව	**38,270.76**

රට තුළ පැවති අහිතකර ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම මෙන්ම ජනතාවගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීම අභියෝගයක් විය. විශේෂයෙන්ම සමාජයේ අඩු ආදායම්ලාභී කණ්ඩායම් සඳහා ආහාර ලබා ගැනීමේ හැකියාව සහ ඒ සඳහා ප්‍රවේශ පහසුව පවත්වා ගැනීම ගැටළුවක් බැවින්, 2024 අතිරේක සහයක් ලෙස සහල් ලබා දීමෙන් ඔවුන් ආරක්ෂා කිරීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන යටතේ 2024 අප්‍රේල් සහ මැයි මාසවලදී දිස්ත්‍රික්ක 25 ක අඩු ආදායම්ලාභී පවුල් 3,334,976 ක් සඳහා එක් පවුලකට කිලෝග්‍රෑම් 20 බැගින් සහල් මෙට්‍රික් ටොන් 66,571 ක් බෙදා දෙන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් අඩු ආදායම්ලාභී පවුල් වෙත ප්‍රතිලාභ ලබාදීමට හැකිවිය.

තවද, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්, වී ගබඩා හිමිකරුවන් සහ වී තොග රැස්කරන්නන් ශක්තිමත් කිරීම සහ දිරිමත් කිරීම මෙන්ම ගොවීන්ට ඔවුන්ගේ වී අස්වැන්න සඳහා සාධාරණ මිලක් සහතික කිරීම යන අරමුණු ඇතිව, 2023/2024 මහ කන්නයේ සහ 2024 යල කන්නයේදී රාජ්‍ය හා පෞද්ගලික බැංකු විසින් ලබා දෙන ණය පහසුකම් හරහා වී මිලදී ගැනීම සඳහා සහනදායී පොලී අනුපාතයක් යටතේ ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස බැංකු විසින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්, වී ගබඩා හිමියන් සහ වී තොග රැස්කරන්නන් හට මෙම කන්න දෙකේදී පිළිවෙළින් රුපියල් මිලියන 3,213ක සහ රුපියල් මිලියන 5,486ක ඔඩපණ ණය ලබා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ, 2023/2024 මහ කන්නයේදී, වාර්ෂික සඵලදායි පොලී අනුපාතය වූ 15% න්, වාර්ෂිකව 4% ක පොලී අනුපාතයක් අදාළ බැංකුවලට පොලී සහනාධාරයක් ලෙස මහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලදී. ඒ අනුව, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් විසින් වාර්ෂිකව 11% ක පොලී ප්‍රමාණයක් පමණක් ගෙවන ලදී. එසේම, 2024 යල කන්නයේදී, වාර්ෂික සඵලදායි පොලී අනුපාතය වූ 13% න්, වාර්ෂිකව 4% ක පොලී අනුපාතයක් අදාළ බැංකුවලට පොලී සහනාධාරයක් ලෙස මහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලද අතර, ඒ අනුව, අදාළ ණය ගැතියන් විසින් වාර්ෂිකව 9% ක පොලීයක් පමණක් ගෙවන ලදී.

අස්වැන්න නොමැති කාලය තුල ගොවීන්ගේ ධාන්‍ය සඳහා ඉහළ සාධාරණ මිලක් සහතික කිරීම උදෙසා ධාන්‍ය සුරකුම් මධ්‍යස්ථාන 05 ක මෙහෙයුම් කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සිදුවේ. දළ වශයෙන් මෙට්‍රික් ටොන් 17,200ක ඒකාබද්ධ ගබඩා ධාරිතාවකින් යුත් මෙම ගබඩා පහ අනුරාධපුර, බුත්තල, මන්නාරම, කිලිනොච්චි සහ පොළොන්නරුව යන ප්‍රදේශවල ඉදිකර ඇත්තේ වී, බඩ ඉරිඟු, සෝයා බෝංචි, තල, උඳු, ගම්මිරිස්, රටකජු සහ අනෙකුත් ධාන්‍ය අස්වැන්න නෙළන කාලය තුළ ගබඩා කිරීම සඳහා ය. ගබඩා පහසුකම් වලට අමතරව, වියලීම, පිරිසිදු කිරීම සහ ධාන්‍යවල තත්ත්ව පරීක්ෂාව වැනි පුළුල් පරාසයක සහායක සේවාවන් සපයනු ලබයි. මෙහිදී ගොවීන්ට තම අස්වනු තොග ඇපයක් ලෙස භාවිතා කරමින් ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ පහසුකම් යටතේ සහනදායී පොලී අනුපාතයකට ණය මුදල් ලබා ගැනීමේ හැකියාව පවතී.

2023 වර්ෂයේදී දී ධාන්‍ය මෙට්‍රික් ටොන් 4,404ක් ගබඩා කර ඇත. එසේම මෙම ධාන්‍ය සුරකුම් මධ්‍යස්ථානවල ස්ථාපිත සූර්ය පැනලවලින් රජයට ලැබෙන ආදායමද ඇතුළුව ගබඩා පහසුකම් සැපයීමෙන් රුපියල් මිලියන 20.6ක මුදලක් උපයා ඇති අතර, මෙහෙයුම් හා නඩත්තු වියදම සඳහා මිලියන 38ක මුදලක් වැය වී ඇත. ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ වැඩසටහන යටතේ ගොවීන් 456 දෙනෙකු විසින් සහනදායී පොලී අනුපාත යටතේ රුපියල් මිලියන 257.7 මුදලක් ලබා ගෙන ඇත.

රට පුරා වෙරළබඩ තීරයක් තිබුණද, ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් කුකුළු නිෂ්පාදන මගින් සපයනු ලැබේ. කුකුළු නිෂ්පාදන වන කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදන පිරිවැයෙන් 90% ක් පමණ, සත්ත්ව ආහාර සඳහා වැය වන අතර එම සත්ත්ව ආහාර අවශ්‍යතාවයෙන් 40% ක් බඩ ඉරිඟු මගින් සපුරා ගනු ලැබේ. දේශීය වෙළඳපොලේ බඩ ඉරිඟු නොමැතිකම සහ ආනයන සීමාවන් හේතුවෙන්. වෙළඳපොළේ කුකුළු මස්, බිත්තර සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනවල දැරිය හැකි මිල සහතික කිරීම සඳහා, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත රජය බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 300,000 ක් ආනයනය කිරීමට අවසර ලබා දී ඇති අතර, බඩ ඉරිඟු කිලෝග්‍රෑමයකට රු. 25/= ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් (SCL) පනවා ඇත.

5.2.4 බලපත්‍රලාභී බැංකුවල රන් භාණ්ඩ උකස් කර ඇති පුද්ගලයින්ට සහන සැලසීම

විශේෂයෙන් අඩු ආදායම්ලාභී පවුල් අතර උකස් ණය ජනප්‍රිය ණය ක්‍රමයක් බවට පත්ව ඇත්තේ ඔවුන්ට වෙනත් ණය පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් බැංකුවල සුදුසුකම් නිර්ණායක සපුරාලීමට නොහැකි වීම සහ මෙම උකස් ණයවලට අනවශ්‍ය ලිපි ලේඛන අවශ්‍ය නොවන බැවිනි. උකස් අත්තිකාරම් ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය, ක්ෂුද්‍ර හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ සඳහා අරමුදල් සැපයීම සඳහා භාවිතා කරනු ලබයි. පසුගිය වසරවල ආර්ථික අර්බුදය ,රටේ බොහෝ දෙනෙකුට අහිතකර ලෙස බලපා තිබූ බැවින් අඩු ආදායම්ලාභී කණ්ඩායම් වල ආර්ථික කටයුතු සඳහා සහය වීමට අවශ්‍ය අරමුදල් උකස් අත්තිකාරම් මගින් සපුරාගෙන ඇත. පැවති අහිතකර ආර්ථික තත්වය තුළ උකස් ණය ලබා ගත් සමහර ණය ගැතියන්ට ඒවා නිති පතා ගෙවීමට නොහැකි වූ බැවින් , ඔවුන් සඳහා සහන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වැදගත් විය.

ඒ අනුව ,2024 අගෝස්තු පළමුවන දින සිට බැලපැවත්වෙන පරිදි , අස්වැසුම වැඩසටහනේ ප්‍රතිලාභීන් විසින් බලපත්‍රලාභී බැංකුවලින් ලබා ගන්නා ලද උකස් අත්තිකාරම් සඳහා පොලී සහනාධාරයක් ලබා දීම සඳහා රජය සහන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ, 2024 ජූනි 30 වන දිනට මෙම අත්තිකාරම් ක්‍රියාකාරී කාණ්ඩයේ තිබුනේ නම්, රු 100,000 නොයික්මවන උකස් අත්තිකාරම් සඳහා අවුරුද්දකට 10% උපරිමයකට යටත්ව පොලී සහනාධාරයක් ලබා දෙන ලදී.

මෙම සහන වැඩසටන යටතේ 2024 වර්ෂයේ දී ජාතික ඉතිරි කිරීමේ බැංකුවට රු. 16,077 ක පොලී සහනාධාරයක් ගෙවන ලදී.

06 පරිච්ඡේදය – මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	23	16	07
තෘතීයික	01	01	00
ද්විතීයික	23	20	03
ප්‍රාථමික	12	11	01

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ඇබෑර්තු පවතින තනතුරු වල රාජකාරි ආවරණ කටයුතු අනෙකුත් නිළධාරීන් විසින් සිදුකරනු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

6.3.1- දේශීය පුහුණුව

වැඩසටහනේ නම	පුහුණු කරනලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සිමාව	සමස්ත ආයෝජනය (රු '000)	නිමැවුම /ලබාගත් දැනුම
			දේශීය	
වැට් බද්දේ බලපෑම-2024	සියලුම කාර්ය මණ්ඩලය	දින 02	ගාස්තු රහිත	වැට් බද්ද පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කර ගැනීම.
දෙමුහුන් වාහන සහ නවින වාහන පැදවීම	සියලුම රියදුරන් (6)	දින 01	ගාස්තු රහිත	දෙමුහුන් වාහන සහ නවීන වාහන පිළිබඳ දැනුම ලබා ගැනීම.
වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව	01	වසර 01	92,000	වෘත්තීමය ඉංග්‍රීසි දැනුම වැඩි දියුණු කර ගැනීම.
ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පාඨමාලාව	02	දින 20	120,000.00	ප්‍රවාහන කළමනාකරණය, නීති, රෙගුලාසි සහ යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීම සඳහා දැනුම ලබා ගැනීම.

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම පිළිබඳව හඳුන්වාදීම.	සියලුම කාර්ය මණ්ඩලය	දින 02	ගාස්තු රහිත	දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ණය වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීම.
අයවැය ක්‍රියා පටිපාටිය	සියලුම කාර්ය මණ්ඩලය	දින 01	ගාස්තු රහිත	අයවැය ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුම ලබා ගැනීම.
ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය	සියලුම කාර්ය මණ්ඩලය	දින 01	ගාස්තු රහිත	ප්‍රසම්පාදන ක්‍රමය සහ ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුම ලබා ගැනීම.
මුදල් විශුද්ධිකරණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය	සියලුම කාර්ය මණ්ඩලය	දින 01	ගාස්තු රහිත	මුදල් විශුද්ධිකරණය පිළිබඳ දැනුම වැඩි දියුණු කර ගැනීමට හැකිවීම.
රථ වාහන සංචිතය කළමනාකරණය	01	දින 01	13,500.00	රථ වාහන සංචිත කළමනාකරණය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම.
ශ්‍රී ලංකා සැලසුම් සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන	01	දින 01	ගාස්තු රහිත	නිපුණතා සහ කුසලතා පිළිබඳ දැනුම වැඩි දියුණු කර ගැනීමට හැකිවීම.
රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය	01	දින 01	13,500.00	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම.
රජයේ වැටුප් ලේඛන පද්ධතිය	02	දින 03	42,000.00	රජයේ වැටුප් ක්‍රමය භාවිතා කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම.
ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වියදම් විශ්ලේෂණය සඳහා ඉදිරිපත් කිරීම	03	දින 01	ගාස්තු රහිත	රජයේ ව්‍යාපෘති සඳහා කරන ලද ප්‍රාග්ධන වියදම්, ඒවායේ අඩුපාඩු සහ අනාගතයේ දී සංවර්ධන ව්‍යාපෘති ඵලදායී ලෙස සැලසුම් කිරීම සඳහා භාවිතා කළ හැකි උගත් පාඩම් පිළිබඳ දැනුම ලබා ගැනීම.
රාජ්‍ය සේවාවේ විනය ක්‍රියා පටිපාටිය	01	දින 02	18,000.00	රාජ්‍ය අංශයේ විනය ක්‍රියා පටිපාටි සහ නිලධාරීන්ගේ රාජකාරි වගකීම් පිළිබඳ දැනුම වැඩිදියුණු කර ගැනීම.
ආතති කළමනාකරණය සඳහා වන පුහුණු වැඩසටහන	සියලුම කාර්ය මණ්ඩලය	දින 02	387,270.00	ආතතිය කළමනාකරණය කිරීම තුළින් කාර්ය මණ්ඩලයේ රාජකාරි ඵලදායිතාව වැඩි කිරීම.

6.3.2. විදේශීය පුහුණුව - 2024

වැඩසටහනේ නම	පුහුණු කරනලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ත ආයෝජනය (රු '000)	නිමැවුම /ලබාගත් දැනුම
			දේශීය	
JICA දැනුම සහයෝගීතා වැඩසටහන: කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූල්‍ය සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) ඇතුළුව කලාපීය සංවර්ධනය සඳහා මූල්‍යකරණය	01	සති 02	164,188.12	ජපන් ආර්ථිකයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පිළිබඳ හඳුන්වදීම ජපානයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍යකරණය, මූල්‍ය සංස්ථා සහ නව ප්‍රවණතා, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය හරහා කෘෂිකාර්මික සංවර්ධනයේ සහ ප්‍රාදේශීය සංවර්ධනයේ මෑත කාලීන ප්‍රවණතා හඳුනා ගැනීම.
Belt and Road රටවල් සඳහා ජාත්‍යන්තර නීති ආධිපත්‍යය සඳහා ධාරිතා වර්ධනය සහයෝගීතාව	01	සති 02	149,648.74	ජාත්‍යන්තර වෙළඳ නීති, මුදල් නීති, ජාත්‍යන්තර බදු පාලන පද්ධතිය පිළිබඳව දැනුම ලබා ගැනීම, ද්විපාර්ශ්වික සහයෝගීතාව පවත්වා ගැනීමට සහ ආර්ථික හා වෙළඳ ප්‍රවර්ධනයට දක්වන චීන උත්සාහය පිළිබඳ දැනුම ලබා ගැනීම.
සංවර්ධන රටවල් සඳහා දරිද්‍රතාවය අඩු කිරීමේ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	සති 02	115,776.63	මහජන චීන සමූහාණ්ඩුව විසින් දරිද්‍රතාවය අඩු කිරීමේ උපාය මාර්ගික ප්‍රවේශය සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් සම්බන්ධයෙන් එහි යෙදුම පිළිබඳ දැනුම ලබා ගැනීම. එසේම, වැඩසටහන් මඟින් ප්‍රායෝගික උදාහරණ සඳහා ස්ථාන නැරඹීම් සඳහා යොමු කිරීම.
කුඩා වෙළඳ භාණ්ඩ වෙළඳපොළ ඉදිකිරීම සහ දරිද්‍රතාවය අවම කිරීම සහ තුරන් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	සති 02	143,691.19	ඩිජිටල් අලෙවිකරණය සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙමින් කුඩා වෙළඳපොළවල් ගොඩනැගීම හා ශක්තිමත් කිරීම තුළින් දරිද්‍රතාවය අවම කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම. Yiwu ජාත්‍යන්තර වෙළඳ නගරය පිළිබඳ හැදෑරීමට අවස්ථාවක් ලැබීම.
සංවර්ධනය වන රටවල් සඳහා මධ්‍ය කාලීන සිට දිගු කාලීන දක්වා සංවර්ධන	01	සති 02	155,041.06	තිරසාර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා ව්‍යාපෘති තෝරා ගැනීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ කළමනාකරණය

සැලසුම්කරණය පිළිබඳ සම්මන්ත්‍රණය				යන සියලු අංශවලට තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පය ඒකාබද්ධ කිරීම සඳහා හවුල්කාර රටවල ආවේණික ක්‍රම වැඩි දියුණු කිරීමට දැනුම ලබා ගැනීම.
BRI රටවල් සඳහා මූල්‍ය සහ මූල්‍ය සහයෝගිතා කළමනාකරණය.	01	සති 02	146058.16	චීන මූල්‍ය කළමනාකරණ පිළිවෙත් පිළිබඳ දැනුම, ඔවුන් BRI රටවලට සහාය වී ඇති ආකාරය සහ එම වැඩසටහන යටතේ BRI රටවලට ඇති අවස්ථා පිළිබඳ දැනුම ලබා ගැනීම.
ගෝලීය සංවර්ධන මූලපිරීම යටතේ වාණිජ මණ්ඩල කර්මාන්ත සඳහා ඩිජිටල් ආර්ථිකය සහ කාර්මික වැඩිදියුණු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	සති 02	145,887.97	ගෝලීය සංවර්ධනයට මූලපිරීමේදී ව්‍යවසාය ඩිජිටල් පරිවර්තන අර්ථ නිරූපණය, ඩිජිටල් ආර්ථිකය සහ ඩිජිටල් ආර්ථිකයේ කාර්මික වටිනාකම් යන ක්ෂේත්‍රයන්හි දේශසීමා E-වාණිජ්‍යයේ අපේක්ෂාවන් පිළිබඳ දැනුම ලබා ගැනීම.
සංවර්ධන රටවල් සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ රාජ්‍ය නොවන සංවිධානවල දරිද්‍රතාවය අඩු කිරීමේ ධාරිතා වර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	02	සති 02	264,146.49	2020 වසර වන විට චීනය නිරපේක්ෂ දරිද්‍රතාවය ශුන්‍ය කර ගෙන ඇති ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීම හා ඔවුන් විසින් ක්‍රියාත්මක කර ඇති උපාය මාර්ග සම්බන්ධයෙන් බොහෝ උදාහරණ නිරීක්ෂණය කිරීමට හැකි වීම.
සංවර්ධන රටවල් සඳහා තිරසාර සමාජ සංවර්ධනය සහ දරිද්‍රතාවය අවම කිරීම පිළිබඳ චීනයේ අත්දැකීම් පිළිබඳ සම්මන්ත්‍රණය	02	සති 02	292,923.51	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දරිද්‍රතාවය අඩු කර සමාජ සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ දැනුම ලබා ගැනීම.
වාණිජ හා කර්මාන්ත මණ්ඩලය BRI හවුල්කාර රටවල් සඳහා ව්‍යාපාර පරිසරය ප්‍රශස්තකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	සති 02	147,006.06	BRI හවුල්කාර රටවල් අතර ව්‍යාපාරික පරිසරයක් ඇති කිරීම පිළිබඳ දැනුම සහ චීනය ප්‍රවර්ධනය කරන වෙළඳ පහසුකම් ක්‍රියාවලිය සහ වෙළඳ ගිවිසුම් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
කෘෂිකර්මය සහ ග්‍රාමීය සංවර්ධනය උදෙසා මූල්‍ය අන්තර්කරණය	01	සති 02	107,928.13	සංවර්ධනයේ විවිධාංගීකරණය වූ ආන්තික මූල්‍ය නිෂ්පාදනය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සියලු දෙනා ඇතුළත්ව ගොවීන් වෙත ළඟා වන ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීම.

BRI හවුල්කාර රටවල් සඳහා මූල්‍ය උපාය මාර්ග පිළිබඳ සම්මන්ත්‍රණය	01	සති 02	99524.64	හරිත මූල්‍යකරණය සහ හරිත සංක්‍රාන්තිය, දේශගුණික විපර්යාස හඳුනාගෙන භාවිතය සහ ආයෝජනය තිරසාර සංවර්ධනය, ඩිජිටල් මූල්‍යකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම.
BRI රටවල් සඳහා නැගී එන කර්මාන්ත	01	සති 02	112,546.24	නැගී එන කර්මාන්තවල සංවර්ධන අත්දැකීම් පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම. ප්‍රායෝගික උදාහරණ මත ස්ථාන නැරඹීමට අවස්ථාව ලැබීම.
ශ්‍රී ලංකාව සඳහා PPP මාදිලිය යෙදීම සහ කළමනාකරණය පිළිබඳ පුහුණුව	01	සති 02	112,738.29	PPP යෙදුම් සහ ආකෘති පිළිබඳ දැනුම ලබා ගැනීම, PPP ආකෘතියේ සාර්ථක යොදා ගැනීමට අවශ්‍ය නීති පද්ධතිය ස්ථාපිත කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය ඇගයීම පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම, ශ්‍රී ලංකාවේ PPP ආකෘතිය ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ශක්‍යතාව ගවේෂණය පිළිබඳව දැනුම ලබා ගැනීම.
ආසියාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නිරීක්ෂණ සම්මන්ත්‍රණය	02	දින 03	74,776.72	ආසියාවේ සහ පැසිෆික් කලාපයේ MSME සංවර්ධනය, මූල්‍ය ප්‍රවේශය සඳහා අදාළ ප්‍රතිපත්තිවල ප්‍රවණතා පිළිබඳව දැනුම ලබා ගැනීම, ජාතික හා කලාපීය වශයෙන් MSME පරිසර පද්ධතියක් සැලසුම් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීම.
තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව (ITEC) යටතේ ශ්‍රී ලංකාවේ දීප ව්‍යාප්ත සේවා සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන (ITEC)	01	සති 02	124,919.17	රාජ්‍ය පරිපාලනය, තාක්ෂණ ඒකාබද්ධතාවය, ප්‍රතිපත්ති රාමු සහ AI පරිවර්තන පාලනය පිළිබඳ හොඳම භාවිතයන් පිළිබඳ දැනුම ලබා ගැනීම. සෞඛ්‍ය සේවා සිට අපද්‍රව්‍ය කළමනාකරණය දක්වා විවිධ සාර්ථක අංශ පිළිබඳව හා තිරසාර සංවර්ධනය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනීම.

කෘෂිකාර්මික සහ ඒ ආශ්‍රිත අංශ සඳහා ව්‍යාපෘති ණය දීම	01	දින 05	44,620.00	ව්‍යාපෘති සඳහා ණය දීමේ සංකල්පය, කෘෂිකර්මාන්තයේ සහ ඒ ආශ්‍රිත අංශවල වටිනාකම්, මූල්‍ය අංශ සහ විවිධ ක්‍රියාකාරකම් සඳහා ඒකක පිරිවැය, ණය නිෂ්පාදන සංවර්ධනය කිරීම, ණය දීම සඳහා කණ්ඩායම් ප්‍රවේශය, තාක්ෂණික ආර්ථික ලක්ෂණ සහ වාණිජ ඇගයීම් ශිල්පීය ක්‍රම, මූල්‍ය තක්සේරුව සහ බැංකුකරණ හැකියාව පිළිබඳ දැනුම ලබා ගැනීම.

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.6	වෙනත්	අනුකූල වේ		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු. රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.7	ඉන්වෙන්ට්ර ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (ය්-හ20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරපත් කර තිබීම	අනුකූල වේ		

5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6.	**අභ්‍යන්තර විගණන**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ		
6.4	මු.රෙ. 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	කළමණාකරන විගණන චක්‍රලේඛ DMA1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අදාළ නොවේ		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනයට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛනයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		

9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අදාළ නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ජේදයේ සඳහන් වන විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු, වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ		
10.	**ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ		
12.	**රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14.	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15.	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති ඒඕ චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ		

17.	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනතාවගේ ප්‍රසංශා/චෝදනා පල කිරීමට පහසුකම් සලකා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/20/18 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		

20.	**විගණන ජේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ජේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		